where dreams unite

# wedding mirror

003 ISSUE

JANUARY 2025



## The Radiant Rise of *Abhilashi*



# Our Team

**Editor in Chief**
Buddika Senadeera

**Head of Designer**
*Sampath Dilanka*

**Web Designer**
*Yobivar Studio*

**Writers**
*Malintha Withanage*
*Sewmini Mindika*
*kavi Dimansa*
*Thanudi Kavithma*

**Advertising**
*Sanu Nadeesha*

## Cantact us:

*071 79 79 708*
*077 04 35 882*



Travel mirror
GET YOUR
BACKPACK READY
www.uthmirror.com
Travel mirror
DISCOVER THE ENCHANTMENT OF SRI LANKA:
AN UNFORGETTABLE JOURNEY AWAITS
DISCOVER SRI LANKA'S STUNNING LAGOONS
NATURE'S HIDDEN GEMS AWAIT!
A SPIRITUAL JOURNEY THROUGH
SRI LANKA'S SCENIC SPLENDOR
1st Issue
OUT NOW
Scan for read this magazine
We are now on magzter
www.magzter.com



# මා අතින් ගොඩක් මනාලියන් හැඩ වෙලා තියෙන්නේ උඩරට විදිහට

ජැස්මින් ෆාරුක්

තරුණ රූපලාවන්‍ය ශිල්පිණියක් මෙවර කලාපයෙන් ඔබට අප හඳුන්වා දෙන්නට සිතුවා. ඇය නමින් ජැස්මින් ෆාරුක්. වසර ගණනාවක් තිස්සේ රූපලාවන්‍ය ශිල්පිණියක් ලෙස කටයුතු කරන ජැස්මින් මේ වනවිට තමන්ගේම රූපලාවන්‍යාගාරයක්ද පවත්වාගෙන යමින් සිටියි. මේ දිග හැරෙන්නේ අප ඇය සමග කළ කතා බහයි.



## රූපලාවන්‍ය ක්ෂේත්‍රයට ඔබගේ පිවිසීම සිදුවන්නේ..

මගේ මතකය හැටියට මම රූපලාවන්‍ය ක්ෂේත්‍රයට එන්නේ 2005 වසරේදී. හැබැයි රූපලාවන්‍ය පැත්ත ගැන කිසිම අදහසක් මට තිබුණේ නැහැ. කොහොම හරි පත්තරේ දැන්වීමක් දැකලා මම රූපලාවන්‍ය සම්බන්ධ පාඨමාලාවකට හදාරන්න පටන් ගත්තා. ඒක අවසන් කරද්දි මට දැනුණ දෙයක් තමයි මට එතැනින් ලැබුණ දැනුමේ මදිකමක්. ඉතින් මම තව තවත් රූපලාවන්‍ය ගැන අධ්‍යයනය කරන්න ගත්තා. හාපුරා කියලා මම මගේම කියලා රූපලාවන්‍ය ආයතනයක් පටන් ගත්තේ මගේ නිවසේදී. ඊට පස්සේ මම රූපලාවන්‍ය පැත්තෙන් ඉදිරියට ආවා. හැබැයි අදටත් මම රූපලාවන්‍ය ක්ෂේත්‍රය ගැන ඉගෙන ගනිමින් ඉදිරියට එන කෙනෙක්.

## ඔබ අලුත් තැනක රූපලාවන්‍යාගාරයක් ආරම්භ කළා නේද..

ඔව්, දැන් මගේම කියලා රූපලාවන්‍යාගාරයක් තියෙනවා මහනුවර අංක 443, ප්‍රේරාදෙනිය පාරේ. නිවසේදී කුඩාවට පටන් ගත්තු රූපලාවන්‍යාගාරය පස්සේ මම මේ ස්ථානයට අරගෙන ආවා. ඕනෑම කෙනෙකුට මේ ස්ථානයට ඇවිල්ලා මාව සම්බන්ධ කරගන්න පුළුවන්. මුණ ගැහෙන්න කලින් 0758 896244 හෝ 0777 125544 දුරකතන අංකවලට ඇමතුමක් දීලා එනවා නම් ගොඩක් හොඳයි.

## වැඩිපුරම ඔබ මනාලියන් හැඩ කරන කෙනෙක් නේද..

ඔව්, ගොඩක් වෙලාවට මම කරන්නේ මනාලියන් හැඩ ගන්වන එක තමා. ඒ වගේම රූපලාවන්‍යාගාරයකින් සිදු කෙරන අනෙකුත් සියළුම දේවල් මගේ රූපලාවන්‍යාගාරය හරහා සිදුවෙනවා. විශේෂයෙන්ම හිසකෙස් සැකසීම හැඩ ගැන්වීම ඇතුළුව හැමදේම. මම මුස්ලිම් ජාතිකයෙක්. ඒත්, මම උඩරට, පහතරට, හින්දු, මුස්ලිම්, බටහිර මේ හැම පන්නයකට මනාලියන් හැඩගන්වලා තියෙනවා. ඇත්තටම, ඒක මට ගොඩක් ආඩම්බරයි. මම රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ වැඩ කරන්න අරගෙන දැන් වසර 19කටත් වැඩියි. මනාලියන් 1500කට එහා මගේ අතින් හැඩ වෙලා තියෙනවා. මම ගොඩක් ආස උඩරට විදිහට මනාලියන් හැඩ කරන්න. මම හිතන්නේ මා අතින් ගොඩක් මනාලියන් හැඩ වෙලා තියෙන්නේ උඩරට විදිහට.





## මනාලියන් හැඩගන්වද්දි ඔබගේ යම් ක්‍රමයවේදයක් තියෙනවාද..

ඒක සිද්ධ වෙන්නේ මගේ සේවාව අවශ්‍ය වෙන කෙනාට අනුව. මනාලිය පමණක් හැඩ ගන්වන්න අවශ්‍ය නම් මම ඒ සේවාව විතරක් ලබා දෙනවා. ගොඩක් අය කැමතියි එක තැනකින් හැමදේම කරගන්න. එතකොට අපි එයාට අවශ්‍ය විදිහට අපගේ සේවාව සපයනවා. සියල්ල එක තැනින් කරගන්න කොට අපිට වුණත් අපේ සේවාවේ වගකීමක්, ගුණාත්මක බවක් වගේම අය කිරීම්වල වෙනසක් වුණත් කරලා දෙන්න පුළුවන්.

## එක වැඩකට ඔබ කොපමණ කාලයක් ගන්නවද..

මම මනාලියකට අන්දවනවා නම් අඩුම තරමේ පැය හතරක් හෝ ඊට වඩා වැඩි කාලයක් ගන්නවා. ඒකට හේතුව තමයි මා විසින් පමණයි ඒ මනාලියව අන්දවන්නේ හා හැඩ කරන්නේ. වෙන කෙනෙක් ලවා මම මනාලියට කොණ්ඩේ කටුවක්වත් ගහන්නේ දෙන්නේ නැහැ. දිනකට මම වැඩ දෙකකට වඩා භාරගන්නේ නැහැ. දවසටම එක වැඩක් පමණක් භාරගත්තු අවස්ථා මගේ ජීවිතේ ඕනා තරම් තියෙනවා. විවාහය කියන්නේ මනාලියකගේ ජීවිතේ සුන්දරම දවස. ඉතින් ඒ දවසේ ඇය ලස්සනටම ඉන්න ඕනා. ඒ වගකිම තියෙන්නේ මා අතේ. අපි අය කරන මුදලට සාධාරණයක් කරන්න ඕනා වගේම ඇයගේ ජීවිතේ වටිනාම දවසේ ඇයව ලස්සනට සතුටින් තියන්න ඕනා.

## මනාලියන් හැඩගන්වද්දි ඔබට අමතක නොවන සිදුවිම් එහෙම තියෙනවද

දවසක් හරි අපුරු වැඩක් වුණා. මම තමයි මනාලියව පළවෙනි දවසේ ඇන්දුවේ. දෙවැනි දවසේ මනාලියගේ පැත්තෙන් කවුද කෙනෙක් එයාව අන්දවන්න භාරගෙන තිබුණා. ඒ දවසේ මම තව වැඩක් භාරගෙන කරගෙන යන කොට අර මම පළවෙනි දවසේ අන්දවපු මනාලියගේ නංගි කතා කරලා කියනවා අක්කේ අපේ අක්කා හොඳටම අඬනවා එයාව කැතට අන්දවලා මොකක් හරි කරලා එයාව ලස්සන කරලා දෙන්නකෝ කියලා. මම වැඩක් භාරගෙන කරගෙන යන අතරේ මේ ඇමතුම ආපු හින්දා මම කිව්වා මම දැන් වැඩක් භාරගෙන කරන ගමන් ඉන්නේ කියලා. එයාගේ දෙවැනි දවස තිබුණේ රෑ නිසා මම කිව්වා මොනවා හරි කරලා දෙන්නම් එන්න කියලා. ටික වෙලාවක් යද්දි ඒ මනාලිය ආවා මගේ තැනට. දැක්කාම ගොඩක් දුක හිතුණා. පස්සේ එයාව නාවලා අරගෙන ආයේ මුල ඉඳලාම අන්දවලා ලස්සන කරලා එයාගේ දෙවැනි දවසට සුදානම් කළා.

## මේ ගමන එන්න ඔබට සහයට හිටපු පිරිසකුත් ඇති..

ගොඩක් දුක් විඳලා, මහන්සි වෙලා තමා මම මේ තැනට ආවේ. හැබැයි ඒ වින්ඳ දුක්වලට අද නියම ප්‍රතිපල ලැබිලා තියෙනවා කියලා මට හිතෙනවා. එදා වගේම අදත් මේ ගමන එන්න මට ලොකුම සහයෝගය ලැබුණේ මගේ පවුලේ අයගෙන්. විශේෂයෙන්ම මතක් කරන්න ඕන මේ ක්ෂේත්‍රයට යොමු වෙන්න අවශ්‍ය කරන දැනුම ලබාදුන් මගේ ගුරුවරුන්ව. ඒ වගේම මගේ යහළුවන්, නැදෑයින් මේ හැමෝමත් ආදරයෙන් මතක් කරන්න ඕනා.





# වසර තුනක් තිස්සේ
# ඡායාරූප ශිල්පියෙක් විදිහට
# ආපු ගමන ගැන සතුටුයි

ඉරේෂ් මධුෂාන්

ඡායාරූප ක්ෂේත්‍රය තුළ නමක් දිනාගත් තරුණ ඡායාරූප ශිල්පියෙකු වන ඉරේෂ් මධුෂාන් වසර කිහිපයක සිට ඡායාරූපකරණයේ යෙදෙන්නෙකි. වර්තමානය වන විට වෘත්තිය මට්ටමේ විවාහ මංගල ඡායාරූප ශිල්පියෙක් ලෙස ප්‍රසිද්ධව සිටින ඉරේෂ් තමන් ආ ගමන අපට පැවසුවේ මේ අයුරිනි.



## ඔබ ඡායාරූප ශිල්පියෙක් වුණේ කොහොමද..

ඇත්තටම මේක මගේ තිබුණ ලොකු ආසාවක්.. හීනයක්.. කිව්වොත් හරි. ඉතින් ඒ දැකපු ලස්සන දේට මම ආදරේ කළා. ඒ වෙනුවෙන් කැපවුණා. මුලින්ම මම කැමරාවක් අතට අරගෙන සහයකයෙක් විදිහට වැඩ කරන්න ගත්තේ 2020 වසරේදී. පස්සේ මම හිතුවා ඡායාරූප ශිල්පය ගැන වැඩිදුරටත් ඉගෙන ගන්න. එහෙම හිතලා මම නුගේගොඩ "පික්සල් ආර්ට් පොටෝ ඇකඩමි" එකට සම්බන්ධ වුණා. එකෙන් පස්සේ මම පූර්ණ කාලීනව ඡායාරූප ශිල්පයට යොමු වුණා.

## ඔබ විවාහ මංගල ඡායාරූප ශිල්පියෙක්ද..

ඔව්, එහෙම මාව හැඳින්නුවොත් වරදක් නැහැ. මොකද, ගොඩක් අය මාව දන්නේ එහෙමයි. හැබැයි මම අනෙක් ඡායාරූප ශිල්පින් වගේ තමා. එකම දේකට සීමාවෙලා නැහැ. මංගල ඡායාරූප ගන්නවා වගේම නිරූපණයට සම්බන්ධ අයගේ ඡායාරූප ගන්නවා. තව ප්‍රිය සම්භාෂණ උත්සව, උපන්දින ඡායාරූප වගේ දේවල් එහෙමත් මම ආවරණය කරනවා. මේ දවස්වල ගොඩක්ම මම කාර්යබහුල වෙලා තියෙන්නේ පෙර පාසල් විවිධ ප්‍රසංග ආවරණය කරන නිසා. ඡායාරූප ශිල්පියෙක් විදිහට වැඩ කරන ගමන් මම විඩියෝකරණය ශිල්පියෙක් විදිහටත් කටයුතු කරනවා.

## මතකද මංගල ඡායාරූප ශිල්පියෙක් විදිහට ඔබේ පළමු රාජකාරිය..

ඔව්, ඒ මනාල යුවල මගේ මතකය හැටියට කැගල්ල පැත්තේ දෙන්නෙක්. මා කරපු ඡායාරූප වගයක් මගේ ෆේස්බුක් පිටුව හරහා දැකලා තමා මේ වැඩේ ලැබුණේ. ඒ දෙන්නාගේ ඡායාරූප මම ගත්තේ පොළොන්නරුවේ ගල් විහාරයේ නිශ්ශංක ලතා මණ්ඩපයේ.

**ජීවිතේ වැදගත්ම දවස අමතක නොවන මතකයන් එක්ක ලස්සනට ඡායාරූප ටිකක් අරගෙන දෙන එක ඡායාරූප ශිල්පියෙක් විදිහට මගේ වගකීම.**



පළවෙනි වැඩේ නිසා මමයි මගේ සහයකයයි ඒ තැනට ගියේ පාන්දර 5.30ට වගේ. මොකද, පළවෙනි වැඩේ නිසා මම ටිකක් බය වෙලා හිටියේ. හැබැයි කරපු පළමු වැඩේ මම හිතුවටත් වඩා ලස්සනට හොඳටම කෙරුණා. ඒ අයත් ගොඩක් කැමති වුණා මගේ ඡායාරූපවලට. පළවෙනි වැඩේ කියලා මම කිසිම ආධුනික බවක් පෙන්නුවේ නැහැ. සාමාන්‍යයෙන් ඡායාරූප ගන්න විදිහට ඒ අයත් එක්ක වැඩ කළා. ඇත්තටම පළමු අත්දැකීම මට කවදාවත් අමතක වෙන්නේ නැහැ.





**හැබැයි කරපු පළමු වැඩේ මම හිතුවටත් වඩා ලස්සනට හොඳටම කෙරුණා.**

**ඒක මගේ ඡායාරූප දිවියේ කවදාවත් අමතක නොවන සිදුවීමක්.**

## විවාහ මංගල ඡායාරූප ශිල්පියෙක් විදිහට දැන් ඔබ කොපමණ ප්‍රමාණයක් වැඩ කරලා තියෙනවද..

ඒක නම් මට කියන්න අමාරුයි. පළවෙනි වැඩේ මම කළේ මීට වසර තුනකට කලින්. එතැන් පටන් මේ ගෙවුණ කාලය තුළ මම ලංකාවේ විවිධ පැතිවලට ගිහිල්ලා තියෙනවා වැඩ කරන්න. ගොඩක් මට වැඩ ලැබුණේ විවිධ අයගේ ඇඳුනුම්කම් මත. අනික මම මේ වැඩේට කැමතියි. කෙනෙකුගේ ජීවිතේ වැදගත්ම දවසක් තමයි විවාහ මංගල දවස. ඉතින් ඒ දවස අමතක නොවන මතකයන් එක්ක ලස්සනට ඡායාරූප ටිකක් අරගෙන දෙන එක ඡායාරූප ශිල්පියෙක් විදිහට මගේ වගකීම. ඉතින් මේ ගෙවුණ වසර කිහිප තුළ බොහෝ දෙනෙකුගේ ලස්සනම දවස මගේ ඡායාරූපවලින් හැඩ කරලා තියෙනවා. ඒ දේවල් අදටත් මම දකිද්දි මගේ හිතට දැනෙන්නේ කියන්න බැරි සතුටක්.

## ඡායාරූප ගනිද්දි අමතක නොවන සිදුවිම් එහෙම නැද්ද..

ගොඩක් තියෙනවා ඒ වගේ සිදුවිම් නම්. මගේ මතකයේ රැඳෙන සිදුවිමක් තියෙනවා. මම ඡායාරූප ගත්ත හොඳම විවාහ මංගල්‍යයක්. ඉතින් මට ආස හිතුණා ඒ දෙන්නට මගේ අතින් අපූරු තැග්ගක් දෙන්න. විවාහ මංගල්‍යය යන අතරේ DJ කරපු කෙනා මගේ තැග්ග ගැන කියලා ඒ දෙන්නව පුදුම කළා. මටත් හිතාගන්න බැහැ. ඒ දෙන්නා මගේ තැග්ග දැකලා ගොඩක් සතුටු වුණා. ඒක මගේ ඡායාරූප දිවියේ කවදාවත් අමතක නොවන සිදුවිමක්.

## ඡායාරූප ශිල්පියෙක් විදිහට ආපු ගමන ගැන මොකද හිතෙන්නේ...

ආපු ගමන ගැන හිතනවා නම් ඇත්තටම මට ගොඩක් සතුටුයි. මගේ ගම පොළොන්නරුව. ඉතින් අද මම ඒ පැත්තේ ගොඩක් අය දන්න ජනප්‍රිය ඡායාරූප ශිල්පියෙක්. දැන් මම පොළොන්නරුවෙන් පිට වැඩත් කරනවා. වරක් මම ගාල්ලට ආවා විවාහ මංගල්‍යයක් ආවරණය කරන්න. ඒක තමයි මම කරපු දුරම විවාහ මංගල්‍යය. ඡායාරූප ශිල්පියෙක් විදිහට ලොකු ගමනක් යන්න මම දැන් සැළසුම් කරමින් ඉන්නවා. මම හිතන්නේ තවම මම මේ ක්ෂේත්‍රයට අලුත්. තව බොහෝ දේවල් මේ ක්ෂේත්‍රය තුළ ඉගෙන ගන්න තියෙනවා. ඡායාරූප ශිල්පියෙක් විදිහට ඉදිරියට එන්න පන්නරය ලැබුණේ මා ඉගෙන ගත්ත පාසලෙන්. ඒ ලිලාරත්න විජේසිංහ මහා විද්‍යාලය. තවමත් මම මුලින්ම වැඩ කරන්න ගත්ත කැමරාව මා සතුව තියෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනා මගේ කැමරාවට මුලින්ම කැමරා කාචයක් ගන්න උදව් කරපු පිරිසව. හැමෝටම බොහෝම ස්තුතිය කියලා ආදරයෙන් මතක් කරනවා.

# සැබෑවටම මනාලියක් වෙන්න
# තව මම හිතලවත් නැහැ

අභිලාෂී සංතුෂ්කි

ජනප්‍රිය කලා නිර්මාණ කිහිපයක් ඔස්සේ මෑත කාලයේ දුටු අභිලාෂී සංතුෂ්කි වර්තමානයේ බොහෝ පිරිසකගේ ආදරය දිනු නවක රංගන ශිල්පිණියකි. මේ නිසාම මෙවර මංගල කලාපයේ මුල් කවරය ඇය වෙනුවෙන් වෙන් කළා. මනාලියක් ලෙස කිහිප වතාවක් හැඩ වී ඇති අභිලාෂී ඒ පිළිබඳව අපට විස්තර කළේ මෙලෙසිනි.





## මුලින්ම අභිලාෂී මනාලියක් විදිහට හැඩවුණ දවස මතකද?

මම මුලින්ම මනාලියක් විදිහට හැඩවුණේ මට වයස අවුරුදු විස්සේදි. එතකොට මම කලාවට සම්බන්ධ වෙලා හිටියේ. හැබැයි ඊට කලිනුත් ඔය වගේ අවස්ථා මට ආවා. නමුත්, මම භාරගත්තේ නැහැ. කලාවට සම්බන්ධ වුණාට පස්සේ මුලින්ම මම මනාලියක් ලෙස හැඩ වුණේ සුභාෂ් අබේවික්‍රම අතින්.

## දැනට කී වතාවක් අභිලාෂී මනාලියක් ලෙස හැඩ වෙලා තියෙනවාද?

දැනට නම් දෙපාරයි මම මනාලියක් විදිහට හැඩ වෙලා තියෙන්නේ. උඩරට මනාලියක් විදිහට මම මුලින්ම සුභාෂ් අතින් හැඩ වුණා. ඊට පස්සේ සංගීත් අයියාගේ සැලෝන් ප්‍රභූ එකෙන් බටහිර මනාලියක් මාව හැඩ ගැන්වූවා. මම හිතන්නේ නැහැ ආයෙත් පාරක් මම මනාලියක් විදිහට හැඩවෙයි කියලා. මොකද, තරුණියකගේ ජීවිතේ සොඳුරම දවස තමයි විවාහ වෙන දවස. ඒ නිසා මම හිතුවා ආයෙත් මාව මනාලියක් විදිහට හැමෝටම දකින්න ලැබෙනවා නම් ඒ මම විවාහ වෙන දවසේදි තමයි කියලා.

## අභිලාෂී වැඩිපුරම කැමති වැඩිපුරම මොන විදිහේ මනාලියක් විදිහට හැඩ වෙන්නද?

කලින් සඳහන් කල විදිහට මම තවම දෙපාරයි මනාලියක් විදිහට හැඩ වෙලා තියෙන්නේ. එක පාරක් උඩරට විදිහටත්, අනිත් පාර බටහිර විදිහටත්. ඔය දෙකෙන් ගත්තොත් මම වැඩිපුරම කැමති උඩරට මනාලියක් විදිහට අඳින්න. මම පළවෙනි පාරට මනාලියක් විදිහට හැඩවුණ අවස්ථාවේදි ගොඩක් අය කිව්වා මාව උඩරට මනාලියක් විදිහට හරි ලස්සනයි කියලා. හැබැයි ඉතින් ඒ හා සමානව බටහිර මනාලියක් විදිහට හැඩවුණ අවස්ථාවෙත් මම ගොඩක් ලස්සනට හිටියා. ගොඩක් අයගේ හොඳ ප්‍රතිචාරත් ලැබුණා.

## ආයෙත් පාරක් හිතුණොත් මනාලියක් විදිහට අඳින්න?

එහෙම හිතුණොත් මම ආසම ඔසරියට සාරියට හැඩවුණ මනාලියක් වෙන්න. දමිල, ඉන්දියන්, බටහිර මනාලියක් විදිහට හැඩ වෙන්නත් ආසයි මම. මොකද, මම හිතනවා ඒ හැම සාරි විලාසිතාවකටම ගැළපෙන රූපයක් මට තියෙනවා කියලා. මම ලංකාවේ සංස්කෘතියට ගොඩක් කැමති කෙනෙක්. ඒ හින්දා මම ආයේ පාරක් අඳිනවා නම් තෝරගන්නේ උඩරට විදිහට අඳින්න.

**ආයෙත් මාව මනාලියක් විදිහට හැමෝටම දකින්න ලැබෙනවා නම් ඒ මම විවාහ වෙන දවසේදි**

**මම හිතනවා ඒ හැම සාරි විලාසිතාවකටම ගැළපෙන රූපයක් මට තියෙනවා කියලා**



"I deeply value **locality** and our **rich** Sri Lankan **culture**, paying close **attention** to our **unique traditions**. I love dressing in the elegant **upcountry style** with my favorite **osari** and **saree**, as well as in the traditional **lowcountry style.**"





## වෙනසකටත් දමිල හරි මුස්ලිම් විදිහට හරි මනාලියක් විදිහට අඳින්න කැමති නැද්ද?

ඒවාත් හරිම ලස්සනයි. හැබැයි මම දේශීයත්වයට වගේම ලංකාවේ අපේ සංස්කෘතියට ගොඩක් මුල්තැන දෙන කෙනෙක් හින්දා මම ගොඩක්ම අවධානය දෙන්නේ අපේම දේවල්වලට. ඉතින් මම ආසම ඔසරියට සාරියට උඩරට ක්‍රමයට අඳින්න. ඒ වගේම පහතරට විදිහටත් අඳින්න.

**කාන්තාවකට තියෙන ලොකුම හීනයක් තමයි කවදාහරි උඩරට විදිහට මනාලියක් ලෙස පෙනී ඉන්න එක. මටත් එහෙමයි.**

## මනාලියක් විදිහට හැඩවෙලා මුහුණ දුන් අමතක නොවන සිදුවීම් තියෙනවාද?

මනාලියකට අඳිනවා කියන දේම අමතක නොවන සිදුවීමක් තමයි මට නම්. විශේෂයෙන්ම උඩරට මනාලියක් විදිහට අඳින එක. අනික උඩරට විදිහට අඳිනවා කියන්නේ පැය කිහිපයක් එකම තැන ඉන්න ඕනා. අනික ආභාරණ එහෙමත් ගොඩක් පළඳින්න තියෙනවා. ඒවාත් දරාගෙන උඩරට විදිහට ඡායාරූපවලට පෙනී ඉන්නවා කියන්නේ විශාල අභියෝගයක්. මට පුදුම මෙච්චර දේවල් දරාගෙන කාන්තානවෝ කොහොම මනාලියක් විදිහට හැඩ වෙලා ඉන්නවද කියලා. හැබැයි කාන්තාවකට තියෙන ලොකුම හීනයක් තමයි කවදාහරි උඩරට විදිහට මනාලියක් ලෙස පෙනී ඉන්න එක. මටත් එහෙමයි. ඉතින් මට හිතෙනවා මගේ අමතක නොවන සිදුවීම් අතරට උඩරට මනාලියක් විදිහට ඇඳපු සිදුවීමත් එකතු කරගන්න.

## අභිලාෂිව අපිට ඇත්තටම මනාලියක් විදිහට දකින්න ලැබෙන්නේ කවද්ද..

මාව ඇත්තටම මනාලියක් විදිහට දකින්න තව ගොඩක් කල් තියෙනවා. මට තවම අවුරුදු විස්සයි නේ. මම හිතන විදිහට තව අවුරුදු හයක්, හතක් විතර යයි කියලා. මොකද, එහෙම කිසිම සූදානමක් තවම නැහැ මම. කොටින්ම කියනවා නම් හිතලාවත් නැහැ ඒ ගැන තවම. බලමු ඉතින් තව අවුරුදු හයක් හතක් ගියාම සමහර විට දකින්න ලැබෙයි සමහර විට දකින්න නොලැබෙයි.

■ ඡායාරූප - ආවර්ජනා / හැඩ ගැන්වීම - සැලෝන් ප්‍රභූ



# පින්ක් රෝස් කේක්
## පටන් අරගෙන දැන් අවුරුද්දක් වෙනවා

පියුමාලි ශානිකා

උත්සාහය තරම් පුද්ගලයකුගේ ජීවිතය වෙනස් කළ හැකි දෙයක් තවත් නැත. දියුණුවේ මාවත තමා විසින්ම විවර කර ගැනීම කාන්තාවකට අභියෝගයකි. කේක් නිර්මාණ ශිල්පිනියක් ලෙස කවුරුත් හඳුනන, පියුමාලි ශානිකා ගුණසේනද එවැනි දුෂ්කරතා ජයගෙන සිය අරමුණ ජය ගත් කාන්තාවකි. මේ වනවිට ඇය, කේක් නිර්මාණ ශිල්පිනියක ලෙස එම ප්‍රදේශයේ නමක් දිනාගෙනද සිටියි.







මට පුළුවන්කම ලැබුණා විදෙස් රටවල කේක් නිර්මාණ ගැන ඉගෙන ගන්නන්, ඊට පස්සේ මම කළේ ඒ නිර්මාණ ලංකාවේ අපේ මිනිස්සුන්ට ගැළපෙන විදිහට හැදුවා.

මම මංගල කේක්, බබාලාගේ උපන්දින සඳහා නිර්මාණය වන කේක් ඇතුළු ඕනැම කේක් නිර්මාණ මා අතින් දැන් හැදෙනවා.

කේක් හදන්න මම ඉගෙන ගත්තේ මගේ අම්මාගෙන්. කිසිම පන්තියකට හෝ වැඩමුළුවකට සහභාගි වෙලා නැහැ. කේක් හදන අයගෙන් පවා මම උපදෙසක් ගත්තේ නැහැ. මගේ අම්මාට හොඳට කේක් හදන්න පුළුවන්. ඇය නිතරම වගේ කේක් හදනවා. ඒ බලාගෙන තමයි මම කේක් හදන්න ඉගෙන ගත්තේ. කේක් හදන දවසට අම්මාට අත් උදව් දෙන්නේ මම. කොහොම හරි මගේ උනන්දුව තිබුණේ අම්මා වගේ රසට, නිර්මාණශිලිව කේක් හදන්න ඉගෙන ගන්න.

කේක් හදන්න තියෙන උනන්දුව නිසාම මම පස්සේ කේක් වර්ග, කේක් සැරසිලි ක්‍රම ගැන යූ ටියුබ් එකෙන් වගේම අන්තර්ජාලයෙන් සොයා බැලුවා. ඒ හරහා මට පුළුවන් කම ලැබුණා විදෙස් රටවල විවිධ වර්ගයේ කේක් නිර්මාණ ගැන දැනගන්නත් ඉගෙන ගන්නත්. ඊට පස්සේ මම කළේ ඒ නිර්මාණ ලංකාවේ අපේ මිනිස්සුන්ට ගැළපෙන විදිහට හදන්න. මම නිතරම අත්හදා බැලුවා. පස්සේ මට ඒ වැඩ අල්ලගන්න පුළුවන් වුණා. හිතුවා මගේම කියලා ව්‍යාපාරයක් පටන් ගන්න කාලේ හරි කියලා. එහෙම අදහසකින් තමයි පින්ක් රෝස් කියලා කේක් ව්‍යාපාරයක් පටන් ගත්තේ. රත්නපුර, කහවත්ත මගේ ගම. මගේ නිවසත් පිහිටලා තියෙන්නේ එහේ. පින්ක් රෝස් ව්‍යාපාරය පටන් ගත්තෙත් මගේ නිවසේමයි.

දැන් මම මංගල කේක්, බබාලාගේ උපන්දින සඳහා නිර්මාණය වන කේක් ඇතුළු ඕනැම කේක් නිර්මාණ මා අතින් දැන් හැදෙනවා. ගොඩක් පරිභෝගිකයින් පිරිසක් දැන් මා සමග ඉන්නවා. ඒ අයගේ ප්‍රතිචාරත් ගොඩක් ඉහළයි. හැමෝම කියනවා මගේ කේක් රසයි වගේම හොඳ නිර්මාණශිලියි කියලා. ඉතින් ඒ අය හරහා ගොඩක් පරිභෝගික පිරිසකුත් අද වෙන කොට මා සමග සම්බන්ධ වෙලා ඉන්නවා.

කාන්තාවකට කේක් නිර්මාණ කලාවෙන් විශාල ආර්ථික මට්ටමක් ළඟා කරගන්න පුළුවන්. ඒ වගේම ඕනෑම කෙනෙකුට තමන්ගේම කියලා කේක් නිර්මාණ ව්‍යාපාරයකුත් පවත්වගෙන යන්න පුළුවන්. මේක කිසිම ආතතියකින් තොරව හිතේ සතුටින් කරගෙන යන්න පුළුවන් නිර්මාණශිලි ක්ෂේත්‍රයක් විදිහටයි මම දකින්නේ. ඕනැම වැඩකදී මුල් කාලයේ ගෙවා ගන්න හරිම අමාරුයි. මොකද, ක්ෂේත්‍රය ගැන ලොකු අත්දැකීමක් වගේම පරිභෝගියකින්ගේ තියෙන අඩුව නිසා. නමුත්, දැන් තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්. සැළකිය හැකි පරිභෝගිකයෝ පිරිසක් දැන් මා වටා සම්බන්ධ වෙලා ඉන්න නිසා නිතරම වගේ වැඩ ලැබෙනවා.

මේ ශාස්ත්‍රය මට මුලින් කියලා දුන්නේ මගේ අම්මා. ඉතින් අම්මාගේ උදව් නැත්නම් අද මම මේ වගේ තැනක නැහැ. මේ වෙලාවේ ඇයව ඉතාම ආදරයෙන් මතක් කරන්න අවශ්‍යයි. තව මා වටා ඉන්න පාරිභෝගික ජනතාව. ඒ අයගේ ප්‍රතිචාර මත තමයි මේ ව්‍යාපාරය අද මේ වගේ දියුණුවට පත්වෙලා තියෙන්නේ. රත්නපුර, කහවත්ත ප්‍රදේශයේ කෙනෙක් නම් ඔබ කේක් ඇණවුමක් භාරදෙන්න වගේම වැඩි විස්තර දැනගන්න පුළුවන් 0753 444199 කතා කළොත්.





# එන කෙනාට ලස්සන කරලා යවන එක තමා අපේ ප්‍රධානම වගකීම

රශ්මික දිවංජන

ටෙලි නිර්මාණ කිහිපයක් ඔස්සේ අප දුටු රශ්මික දිවංජන (දිවාන්) මේ වනවිට තරුණ ව්‍යාපාරිකයෙකු ලෙසද කටයුතු කරමින් සිටියි. මේ වසරේ මැයි මාසයේදී ඔහු DIWZ නමින් කොණ්ඩා සැකසුම් ආයතනයක් ආරම්භ කළේය. එය මිගමුව, තෙල්වත්ත හංදියේදී පිහිටා තිබෙන අතර, එය මිගමුව ප්‍රදේශයේ ඉතා ජනප්‍රිය කොණ්ඩා සැකසුම් ආයතනයක් වෙයි. මේ දිග හැරෙන්නේ දිවංජන සිය ව්‍යාපාරය ගැන දැක්වූ අදහස්..





## ඇය ඔබ කොණ්ඩ කැපීම් ශිල්පියෙක් වෙන්න හිතුවේ..

අවුරුදු පහක් විතර මම කෝණ්ඩා සැකසුම් ශිල්පිය ඉගෙන ගත්තා. මොකද, ඕනෑම ක්ෂේත්‍රයකට පිවිසෙන්න කලින් ඒ පිළිබඳව දැනුමක් ලබා ගැනීම වැදගත්. ඒ නිසා මම මේ පිළිබඳව අධ්‍යයනය කළා. හැබැයි කියන්නම ඕනා පොඩි කාලේ මේ පැත්තට යොමු වෙන්න මගේ ආසාවක් තිබුණා. තෙරේන කාලේ ඉඳලා අමතර පන්ති යනකොට මගේම කොණ්ඩේ මම විවිධ විලාසිතාවලට හදාගත්තා. මම කරන කොණ්ඩ විලාසිතා දැකලා වෙලාවකට මගේ යාළුවෝ පවා ඇවිල්ලා ඒ අයගේ කොණ්ඩත් ඒ විදිහට හදාගන්නවා. ඉතින් ඒ තිබුණ ආසාවට තමයි මම මේ පැත්තට යොමු වෙන්න උනන්දු වුණේ..

## එතකොට මේ වගේ ආයතනයක් පටන් ගන්න මුල පිරුවේ..

පොඩි කාලේ ඉඳලා කොණ්ඩ කපන්න විලාසිතා දාන්න ආසාවක්.. කැමැත්තක්.. තිබුණාට කවදාවත් මම හිතුවේ නැහැ මගේ කියලා කොණ්ඩ කැපීමේ ආයතනයක් දාන්න. කොළඹ ඇවිල්ලා යාළුවොත් එක්ක ගත කරන කොට හිතුණා ලංකාවෙත් දැන් පිටරට වගේ හේයාර් ස්ට්‍රයිල් කරන්න හැමෝම ලොකු උනන්දුවක් දක්වනවා දැක්කා. පස්සේ මට හිතුණා මේක අද වෙන කොට හොඳ ආර්ථික ලාභ ලැබිය හැකි වෘත්තියක් වගේම ව්‍යාපාරයක් කියලා. ඒ අදහස මුදුන්පත් කරගෙන තමයි මම ගිය වසරේ මැයි මාසයේ දෙවැනිදා මගේම කියලා කොණ්ඩ සැකසුම් ආයතනයක් ආරම්භ කළේ.

## කොණ්ඩ කපන එක පමණද මෙතැනින් සිදුවෙන්නේ..

නැහැ, මේ කොණ්ඩේ කපන එක විතරක් නෙවෙයි අපි කරන්නේ. කොණ්ඩ විලාසිතා දානවා. කොණ්ඩේ වර්ණ ගන්නවා. ඒ වගේම කොණ්ඩේට අවශ්‍ය කරන තෙල් සාත්තුව, ඔළුව සම්භාහනය මේ හැමදෙයක්ම කරනවා. මේ දේවල් කාන්තා පිරිමි භේදයකින් තොරව අපි කරනවා. තවත් දෙයක්. ඉස්සර මනාලියෝ පමණයි නේ සැලොන් වලට ගියේ. දැන් මනාලයොත් එනවා සැලෝන් එකට තමන්ගේ විවාහ දවසේ ලස්සනට හැඩ වෙලා පෙනි ඉන්න. ඉතින් අපගේ සැලෝන් එක හරහා අලුත විවාහ වන තරුණයින්ටත් ඔවුන්ගේ ලස්සන දවස හැඩට ඉන්න අප හරහා අවශ්‍ය කොණ්ඩ විලාසිතා, මේකප් වගේම පේශල් වගේ දේවල් අප ආයතනය හරහා සිදු කරගන්න පුළුවන්.











## කොහොමද ඔබේ ආයතනයට පරිභෝකයින්ගේ පැමිණීම..

පාරිභෝගිකයන්ගේ පැමිණීම ඉතා හොඳයි. ලොකු පිරිසක් මාව දන්නවා. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය හරහා. ගොඩක් අය හිතන්නේ මගේ මේ සැලෝන් එක තියෙන්නේ කොළඹ කියලා. හැබැයි මගේ සැලෝන් එක තියෙන්නේ මිගමුවේ. ඉතින් ගොඩක් අය මගේ සැලෝන් එක හොයාගෙන මිගමුවට එන අවස්ථාත් තියෙනවා. දිනකට විශාල පිරිසක් අප සමග සම්බන්ධ වෙනවා. අපි අපේ සේවාව පරිභෝගිකයාට දැනෙන්න උපරිම හොඳින් ලබා දෙනවා. දහ දෙනෙක් ගත්තොත් එකෙන් අට දෙනෙක් නැවත වතාවක් අපේ ආයතනයට එනවා තමන්ගේ අවශ්‍යතාවය ඉටු කරගන්න. මම කලා ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙක් දන්න කෙනෙක්. නිතරම වගේ ඔවුන් මිගමුවට එනවා මගේ සැලොන් එකේ කොණ්ඩ විලාසිතා කරගන්න.

## දවසින් දවස අලුත් වෙන දෙයක් තමා කොණ්ඩ විලාසිතා කියන්නේ..

ඔව්, ඒක අපේ පැත්තෙනුත් අනිවාර්යයෙන්ම සිදුවෙන දෙයක්. අපි ලෝකයත් එක්ක ඉදිරියට යන නිසා ජාත්‍යන්තරයට එන අලුත් විලාසිතා ගැන අපි නිතරම පාරිභෝගිකයා දැනුම්වත් කරනවා. ඒ වගේම ඔවුන්ගේ මුහුණට ගැළපෙන කොණ්ඩ විලාසිතා ඉදිරිපත් කරනවා. ගොඩක් අය අපි පෙන්වන අලුත් විලාසිතාවලට කැමැත්තක් දක්වනවා. ඊට අමතරව අපිට කෙනෙක්ගේ මුහුණ දැක්කාම එයාට අවශ්‍ය මේ වගේ විලාසිතාවක් කියලා තේරුම්ගන්න හැකියාවක් තියෙනවා. ඉතින් ගොඩක් වෙලාවට අපි කරන්නේ අපේ සේවය ලබාගන්න එන කෙනාව මෙතැනින් ලස්සන කරලා යවන එක.

## කොණ්ඩා කැපීම් ශිල්පියෙක් විදිහට ආපු ගමන ගැන..

මම මේක වසර ගණනාවක් ඉගෙන කරගන්න ගත්ත වෘත්තියක්. මම රංගන ශිල්පියෙක් හැබැයි. මගේ වෘත්තිය තමයි මේක. රංගනය කරන්නේ ඇත්තටම ඒකට තියෙන ආසාවට. කොණ්ඩා කැපිම් ශිල්පියෙක් විදිහට ආපු ගමන ගැන ගොඩක් මට සතුටුයි. ඒකට හොඳම උදාහරණය තමයි මට මේ වැඩේ හරියටම කරන්න හොද ගුරුවරු කිහිප දෙනෙක්ගේ උදව් ලැබුණ ඒක. සැලෝන් ලියෝ හිමිකරු ධනුෂ්ක චතුරංග, මූජි ද සිල්වා මිස් මතක් කරන්න ඕනා. ඒ එක්කම මගේ හොඳම යාළුවා සංගීත ප්‍රභුවත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනා. සැලෝන් එක පටන් ගත්තු කාලේ ඉඳලා අද වෙනකම් මා වටා හොඳ පරිභෝගිකයෝ පිරිසක් එකතු වෙලා ඉන්නවා. මම දකින්නේ මගේ වැඩ හොඳ නිසා මගේ සේවය ලබා ගන්න මාත් එක්ක ඉන්නවා කියලා. ඒ හැමෝටම මේක අවස්ථාවක් කරගන්නවා මම ස්තුති කරන්න.

# මීළඟට නිකුත් කරන

where dreams unite
wedding mirror

# කලාපයෙන් මෙන්න ඔබටත් ඉඩක්...



ඔබත් ඡායාරූප ශිල්පියෙකු, රූපලාවන්‍ය ශිල්පියෙකු
හෝ මංගල ක්ෂේත්‍රයට සම්බන්ධ අයෙකු නම්
ඔබේ සේවයට අපෙන් පුළුල් ප්‍රචාරයක් ලබා ගැනීමට දැන් ඔබට පුළුවන්

තවද මනාලියක් ලෙස හැඩවුණ ඔබේ රුවින්
සඟරාවේ **Wedding Mirror** සඟරාවේ මුල්පිටුව
මෙන්ම ඇතුළත පිටු සරසවන්න ඔබ කැමතිද?

එහෙනම් දැන්ම අමතන්න
**0717 979708**

# GLAMOUR ON THE SECOND DAY



Bridel
Nishika

showcasing her **captivating** beauty and timeless **elegance**, redefining fashion's **allure**.





පසුගිය වසරේ පැවති මිසිස් ශ්‍රී ලංකා රූපරාජිණී තරගයේ අවසන් තරගකාරියන් අතරට තේරීපත් වූ නිශිකා රන්දෙණිය මේ වනවිට නිරූපණයට යොමුව සිටියි. දෙවැනි ගමනට සුදුසු මනාලියක් ලෙස හැඩ වී මෙවර කලාපය සරසන්නේද ඇයයි. නිශිකා වෘත්තියෙන් ඉංග්‍රීසි ගුරුවරියක් ලෙස කටයුතු කරන අතර, Hatton National Bank Assurance හි වෙළෙඳ කළමණාකාරිනිය ලෙසද කටයුතු කරමින් සිටියි.

**ඡායාරූප** - චිරංග පිළිමතලාව
**හැඩ ගැන්වීම** - ඉරෝමා විජේවර්ධන



# ජීවිතේ වටිනාම දවසේදී හොඳම සාරියකින් හැඩ වෙන්න

විවාහ මංගල්‍යය සැලසුම් කිරීමේදී මංගල ඇඳුම තෝරා ගැනීම ඒ අතරින් සුවිශේෂී වෙයි. මංගල ඇඳුම යනු මනාලියගේ සුන්දරත්වය ඉස්මතු කරන ආකර්ෂණීය කොටසකි. අනෙකුත් කාරණාවලටත් වඩා මංගල ඇඳුම තෝරා ගැනීමේදී පෙර සූදානම ඉතාමත් වැදගත් බව මතක් කළ යුතු වේ. මන්දයත්, සිරුරේ සුන්දරත්වය ඉස්මතු වන්නේ සාරිය තුළිණි.



මංගල දිනයට අඳින සාරිය තෝරා ගැනීමට පෙර මුලින්ම තමාගේ සිරුරේ හැඩය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. ඒ පිළිබඳ යම් අවබෝධයක් නැත්නම් විලාසිතා මාර්ගෝපදේශකයෙක්ගේ හෝ රූපලාවන්‍ය ඇත්දැකීම් ඇති අයෙකුගෙන් හෝ අන්තර්ජාලයෙන් උපදෙස් ලබාගත යුතුවේ. එමෙන්ම සාරිය තෝරා ගැනීමේදී සිරුරේ හැඩය මෙන්ම සිරුරේ පැහැයද එකසේ වැදගත්ය.

බොහෝ දුරට මංගල ඇඳුම තෝරාගැනීමේදී මංගල උත්සවය පවත්වන්නා වූ ස්ථානය පිළිබඳ නොසැලකිල්ලෙන් ඇඳුම් තෝරා ගැනීමෙන් මනාලයා අපහසුතාවයට පත්වන අවස්ථා ද ඇත. උදාහරණයක් ලෙස මුහුදු වෙරළ ආශ්‍රිතව පවත්වන්නා වූ මංගල උත්සවයකදී මනාලියකට Ball Gawn, Stilettos වර්ගයේ ඇඳුම් නොගැළපේ.

පිරිපුන් පැහැපත් සිරුරක් හිමි මනාලියකට හොඳින් තම සිරුරට ඇලි සිටින ආකාරයේ රෙදි වර්ගයකින් මංගල ඇඳුම තෝරා ගත යුතුය. සිහින් සිරුරක් හිමි මනාලිය ඕගන්දි, ඩූම්, ලේස් වැනි රෙදි වර්ග වලින් නිම කල සාරි තෝරාගතත යුතුය. සාරියේ පැහැය තුළින් මනාලියගේ වර්ණය ඉස්මතු කරන නිසා පැහැපත් මනාලියකට නම් ඕනෑම වර්ණයක් ගැලපෙන අතර පැහැයෙන් අඩු මනාලියකට ඩල් ගෝල්ඩ්,  අයිවරි, ක්‍රීම්, බිස්කට් වැනි පැහැයන්ගෙන් යුක්ත ඇඳුමක් තුළින් සිරුරේ පැහැය ඉස්මතු වේ.

එසේම තවත් වැදගත් වන දෙයක් නම් සිරුරේ ප්‍රමාණය තරමක් වැඩි මනාලියකට සාරියේ තිරස් අතට මෝස්තර යෙදු මෙන්ම ලොකු බෝඩර් සහිත සාරි නොගැලපේ. ඇයට ගැලපෙන්නේ සිරස් අතට මෝස්තර ඇති සාරියි. සිහින් සිරුරක් හිමි මනාලියන්ට



ලොකු බෝඩර් යෙදු තිරස් අතට මෝස්තරයේ සාරි වඩාත් ගැළපෙයි.

පෙර කී සියල්ලම ගැළපුණද එදිනට මනාලියට සුවපහසු ලෙස ඇන්දවීමට, පහසුවෙන් ඇවිදීමට , වාඩිවීමට, නර්තන යෙදීමට තෝරාගත් ඇඳුම තුළින් හැකියාව ඇතිදැයි බැලීම මුලීකවම කළ යුතු දෙයකි. සියළු කරුණු දැනුවත් වූ පසු තමා අත ඇති මුදලට සරිලන සාරියක් තෝරා ගැනීම පිළිබඳ විශේෂයෙන් සැලකිළිමත් විය යුතුය.

කෙතරම් මිල අධික වුවද එය සිරුරට නොගැළපේ නම් මනාලියගේ සුන්දරත්වයට ඉන් බලපෑම් සිදු වෙයි. මනාලිය කෙතරම් කැමැත්තක් දැක්වුවත් ඇගේ පෙනුමට ගැළපෙන දේ පමණක් තෝරා ගත යුතුය. අනවශ්‍ය ලෙස විලාසිතා කිරීම තුළින් මනාලියගේ සුන්දරත්වය මතු නොවීමට පුළුවන. මනාලියගේ ඇඳුම, වර්ණය, නිර්මාණය වන ආකාරය, ආභරණ, මල් කළඹ නිවැරදි ආකාරයෙන් ගළපා ගතහොත් එදිනට මනාලිය අන් අයට වඩා කැපී පෙනෙනු ඇත. බොහෝ විට මනාලිය බලාපොරොත්තු වන්නේද එයයි. එසේම තමන්ගේ හොඳම දවස හොඳම විදිහට පෙනි ඉන්න මේ කරුණු කාරණා අවබෝධ කරගෙන මංගල සාරියක් තෝරා ගන්න.



**රූපලාවන්‍ය උපදේශිකා**
**දිනිෂා එරංගිකා**

# ඡායාරූප ශිල්පියෙක් විදිහට

## වැඩ කරන්න අරගෙන දැන් වසර දහතුනක් වෙනවා

දුලිත ශ්‍රීනාත්





සිය ඡායාරූප කලාව තුළ නිරතුරුවම වෙනසක් කරන්නට උත්සාහ කරන තරුණ ඡායාරූප ශිල්පියෙක් අපට මුණ ගැහුණා. ඔහු නමින් දුලීත ශ්‍රීනාත්ය. වසර දහතුනකට අධික කාලයක් තිස්සේ ඡායාරූප ක්ෂේත්‍රය තුළ අත්දැකීම් එකතු කරගත් මෙම තරුණ ඡායාරූප ශිල්පියා කාලයක් ඡායාරූප මාධ්‍යවේදියෙකු ලෙසද කටයුතු කළ අයෙකුද වෙයි. මේ දිග හැරෙන්නේ ඔහු සමග අප කළ කතා බහයි.





## කොහොමද ඔබ ඡායාරූප ශිල්පියෙක් වුණේ..

ඡායාරූප ශිල්පියෙක් වෙන හීනයක් මට තිබුණා. ඒ නිසා තෙරේන කාලේ ඉඳලා මගේ උනන්දුව තිබුණේ ඡායාරූප ශිල්පියෙක් විදිහට ඉදිරියට එනවා කියන ඉලක්කය. ඔය අතරේ මට අවස්ථාව ලැබුණා. මගේ පවුලේ හිතවතෙක් වෙන කුරුණෑගල අමායා ස්ටූඩියෝ අදිපති අරුණ සාලිය අයියා සමග විවාහ ඡායාරූප කරන්න. මගේ මතකය හැටියට ඒ 2011 වසරේදී. ඔහුත් සමග වැඩ කරද්දි මම ඡායාරූප ශිල්පිය ගැන ඉගෙන ගත්තා. විශේෂයෙන්ම ඡායාරූප කරද්දි ආලෝකරණය භාවිතා කරන විදිහ වගේම ඡායාරූප සංස්කරණය කරන විදිහ ගැන. ඒ දේවල් හොඳට හැදෑරූවාට පස්සේ මම තනිවම වැඩ කරන්න ගත්තා.

## ලොකු කාලයක් ඔබ මේ ක්ෂේත්‍රය තුළ වැඩ කරන්න අරගෙන..

ඔව්, හැබැයි මම මේ අවුරුදු දහතුන තුළ වැඩ කරන ගමන් ඡායාරූප ශිල්පිය ගැන යම් යම් දේවල් ඉගෙන ගත්තා. අදටත් මම ඉගෙන ගනිමින් ඉදිරියට එන ඡායාරූප ශිල්පියෙක් විදිහට හැඳින්වුවත් වරදක් නැහැ. මොකද, මේ ක්ෂේත්‍රය තුළ හැමදාම ඉගෙන ගන්න දෙයක් තියෙනවා හින්දා.

## ඔබ විවාහ මංගල ඡායාරූපකරණයට සිමාවුණ ඡායාරූප ශිල්පියෙක්ද..

මංගල ඡායාරූපකරණයට තමයි මම මුල්තැන දීලා තියෙන්නේ. හැබැයි මම සාමාන්‍ය ඡායාරූප ශිල්පින් වගේම අනෙකුත් ඡායාරූප ගැනීම් සිදු කරනවා. ඒ කිව්වේ, විශේෂ අවස්ථා ආවරණය කිරීම, උපන්දින සාද, නිරූපණ ක්ෂේත්‍රයට සම්බන්ධ අයගේ ඡායාරූප ගැනීම් වගේ දේවලුත් කරනවා. හැබැයි මගේ මූලිකම



සේවය ලබා දෙන්නේ විවාහ මංගල ඡායාරූපකරණයට කිව්වොත් හරි. වසර කිහිපයක්ම මම ලංකාවේ ජනප්‍රියතම පුවත්පතක් වූ තරුණයා පුවත්පතේ ඡායාරූප මාධ්‍යවේදියෙක් විදිහටත් වැඩ කරලා තියෙනවා.

## විවාහ මංගල අවස්ථා දැනට ඔබ කොපමණ ආවරණය කරලා තියෙනවාද..

මගේ මතකයේ හැටියට විවාහ මංගල උත්සව තුන්සියයකට අධික ප්‍රමාණයක් මම දැනට ඡායාරූප ශිල්පියෙක් විදිහට ආවරණය කරලා තියෙනවා. මගේ ගම කුරුණෑගල. දැන් ඉන්නේ රාගම. ඒ වුණත් දැනට මම කරපු විවාහ මංගල උත්සව තිබුණේ ලංකාවේ විවිධ පැතිවල. විවිධ දැනඇඳුණුම් මත මට ලංකාවේ විවිධ පැතිවලින් විවාහ මංගල්‍යයන් සඳහා ආරාධනා ලැබුණා ඡායාරූප ශිල්පියෙක් විදිහට වැඩ කරන්න.

## ඔබේ වැඩවලට අද වෙන කොට වටිනාකම් ලැබිලා තියෙනවාද..

මගෙන් සේවාව ලබාගත්තු අයගෙන් තමා මට ලොකුම වටිනාකමක් අද වෙන කොට ලැබිලා තියෙන්නේ. මේ ක්ෂේත්‍රය තුළ වැඩ කරද්දි බොහෝ අය මුණ ගැහෙනවා විවිධ ක්ෂේත්‍රවල වැඩ කරන. ඒ අයගේ දැන ඇඳුනුම්කමින් වැඩ ගොඩක් ලැබෙනවා. අනික මම කරන වැඩේ උපරිම සාධාරණ විදිහට කරලා දෙන්නේ. මම මගේ වැඩේට සරිලන මුදලක් ගන්නවා ඇරෙන්න ඉතා විශාල ගණන්වලට මම ඡායාරූප කරන්නේ නැහැ. මගෙන් සේවය ලබාගන්න අය පුද්ගලිකව මගේ ඡායාරූප හා මම කරන වැඩේ ගැන සතුටුවෙනවා නම් එච්චරයි මට අවශ්‍යය.

## ඡායාරූප ශිල්පියෙක් විදිහට ආපු ගමන ගැන මොකද හිතෙන්නේ..

ගොඩක් සතුටුයි. මම ක්ෂේත්‍රයට ආවේ ලංකාවේ ඡායාරූප ශිල්පින් මේ ක්ෂේත්‍රය ගැන උනන්දුවෙන කාලේ. එතකොට ලොකු තරගකාරිත්වයක් තිබුණා. මොකද, ගොඩක් තරුණයෝ වෘත්තියක් විදිහට ඡායාරූප ශිල්පය කරන්න ගත්තු නිසා. අදටත් මේ ක්ෂේත්‍රයට එන තරුණ පිරිසේ ලොකු ප්‍රවණතාවයක් තියෙනවා. ආපු ගමන ගැන මතක් කරනවා නම් මගේ පවුලේ අයගෙන් ලැබුණ තල්ලුව ගොඩක්ම වටිනවා. විශේෂයෙන්ම මගේ නිවුන් සහෝදරයාගෙන්. දැන් නම් ගොඩක්ම මට උදව් කරන්නේ මගේ බිරිඳ. ඉතින් මේ ආපු ගමනේදී වචනයකින් හරි උදව්වක් දිපු හැමෝම ඉතාම ආදරයෙන් මතක් කර සිටිනවා.



# මට මේ ගමන එන්න ශක්තිය වුණේ මගේ අම්මා

ශේහාන් ධනපාල





රෑපලාවන්‍ය යනු කලාවකි. මේ කලාව මැනවින් හසුරුවන්නට හැක්කේ බොහෝ අතළොස්සක පිරිසකටයි. මේ සඳහා හොඳ පළපුරුද්දක්.. අත්දැකීම්.. මෙන්ම මනා කැපවීමක්ද අත්‍යවශ්‍යයි. රෑපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රමයෙන් නමක් හදා ගනිමින් ඉදිරියට එන තරුණ රැපලාවන්‍ය ශිල්පියෙකු ශේහාන් ධනංජයද එවැනි තරුණ හා බොහෝ පිරිසක් දන්නා ජනප්‍රිය රෑපලාවන්‍ය ශිල්පියෙක්. මේ නිසාම මෙවර මංගල කලාපයෙන් අප ඔහුටද ඉඩක් වෙන් කළා.

## රෑපලාවන්‍ය ශිල්පියෙක් වෙන්න මාවත සැකසුණේ කොහොමද..

මුලින්ම මගේ පාසලෙන්ම මම පටන් ගන්නම්. මොකද, මම පාසල් කාලයේ ඉඳලම සෞන්දර්‍ය විෂයන්වලට අනෙකුත් විෂයන්වලට වඩා දක්ෂතා දැක්වුවා. විශේෂයෙන්ම චිත්‍ර, නර්තනය හා රංගනයට. කොටින්ම කියනවා නම් මගේ දායකත්වයක් නැතුව මගේ පාසලේ සාහිත්‍ය, කලා තරගයක් තිබුණේ නැති තරම්. මම හිතන්නේ මට කලාවට උපතින්ම හැකියාව තිබුණා කියලා. කලාව තමයි මට මේ රැකියාවට යොමු වෙන්න අඩුතාලම වුණේ. අ.පො.ස උසස් පෙළ විභාගය ලියලා අවසන් වුණාට පස්සේ රමණී ෆර්නෑන්ඩෝ මහත්මියගේ රෑපලාවන්‍ය පාසලට සම්බන්ධ වෙලා ඒ පිළිබඳව දැනුමක් ලබාගත්තා. එම මහත්මියගේ පාඨමාලාව සාර්ථක නිමා කරලා 2020 තමයි මම රෑපලාවන්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්න ගත්තේ.

## ගොඩක් වෙලාවට ඔබ කරන්නේ මනාලියන් හැඩගන්වන එක නේද..

ඔව්, මනාලියන් තමයි මම ගොඩක් වෙලාවට අන්දවන්නේ. මම හිතන්නේ ඒක මගේ අනන්‍යතාවය කියලා. ශේහාන් ධනංජය කිව්වොත් දැන් ගොඩක් අය දන්නවා අර බ්‍රයිඩ්ල් අන්දන බියුටිෂන් කියලා. ඒ තරමට අද මගේ නම හැදිලා තියෙනවා. ඒ වගේම ලොකු පිරිසක් මාව අඳුනනවා. ඒ අඳුනාගැනීම් හරහා වැඩත් ගොඩක් ලැබෙනවා. ඉතින් ගොඩක් සතුටුයි අද මාව මේ ක්ෂේත්‍රය තුළ ජනප්‍රිය වෙලා තියෙන එක ගැන. ඇත්තටම දැනට මම විශාල මනාලියන් පිරිසක් හැඩගන්නවලා තියෙනවා. මගේ මතකයේ නැහැ ඒ කොපමණ ප්‍රමාණයක්ද කියලාවත්.



## තමන්ගේම කියලා රූපලාවන්‍යාගාරයක් ඔබට දැන් තියෙනවා..

ඔව්, Glamour By Dananjaya නමින් මගේම කියලා රූපලාවන්‍ය ආයතනයක් තියෙනවා රාගම. ගොඩක් අය දන්නවා තියෙන තැන. මොකද, මෙතැනට ක්ෂේත්‍රය ගොඩක් අය එන නිසා. අලුත විවාහ වෙන ඕනෑම මනාලියක්ට තමන් හිතේ තියෙන විදිහට හැඩ වෙන්න පුළුවන් මෙතැනට ඇවිල්ලා. වැඩි විස්තර 0702 907614 අංකය අමතලා ලබාගන්න පුළුවන්. එහෙම නැත්නම් මගේ සමාජ පිටු තියෙනවා. ඒවාට සම්බන්ධ වෙලා තොරතුරු දැනගන්නත් පුළුවන්කම තියෙනවා.

## මනාලියන් හැඩගන්වද්දි ඔබ යම් ක්‍රමවේදයක් අනුගමනය කරනවද..

ඔව්, මම වැඩ ගොඩක් එකපාර භාරගන්නේ නැහැ. ඒකට හේතුව තමයි මම කාර්යබහුල වෙන්න කැමති නැහැ. එතකොට මම වැඩක් භාරගනිද්දි මගේ පැකේජ් කිහිපයක් තියෙනවා. එහෙම මම පැකේජ් ක්‍රමයක් අනුගමනය කරන්නේ මා ගාවට එන පාරිභෝගිකයාට දරන්න පුළුවන් මුදලක් ඒ පැකේජ්වල තියෙන නිසා. ගොඩක් වෙලාවට මා ගාවට තමන්ගේ වැඩේ කරගන්න එන පාරිභෝගිකයෝ ඒ අයගේ වැඩේ මට පවරලාම තමා යන්නේ.

## ඔබව දැන් ලොකු පිරිසක් අඳුනන රූපලාවන්‍ය ශිල්පියෙක් කිව්වොත් හරි..

ඔව්, ගොඩක් වෙලාවට මාව හොයාගෙන එන සේවාදාකයෝ ගොඩක් අද ඉන්නවා. මම මිනිස්සු ගොඩක් ඉන්න තැනකට ගියොත් අනිවාර්යයෙන්ම ගොඩක් අය මාව අඳුනගෙන කතා කරනවා. විශේෂයෙන්ම පල්ලියට ගියත්. ඉතින් මිනිස්සු දන්න පුද්ගලයෙක් වීම ඇත්තටම වාසනාවක් කියලා මම හිතන්නේ. ඒක ලොකු සතුටක් මට.





## ආපු ගමන ගැන ධනංජයට මොකද හිතෙන්නේ..

ආපු ගමන ගැන සතුටු වෙන්න පුළුවන්. හැබැයි මම හිතන්නේ මේ ගමනේ මට තව යන්න ලොකු දුරක් තියෙනවා. ගොඩක් මගේ ඉලක්ක තියෙනවා. ඉතින් ඒවාත් සම්පූර්ණ කරගෙන හොඳ යපත් සාර්ථක ගමනක් යන්න මම හිතාගෙන ඉන්නවා. මේ ආපු ගමනේදී මගේ එකම ශක්තිය වුණේ මගේ අම්මා. ඇය නැත්නම් මම අද මෙතැන නැහැ. ඒ වගේම මගේ සහෝදරයෝ දෙන්නා. ඒ දෙන්නා හැමදාම මාව දිරිමත් කළා මේ ගමන එන්න. තව මගේ යහළුවෝ, මා සමග වැඩ කරපු නිරූපණ ශිල්පිණියක්. ඡායාරූප ශිල්පින්, ඇඳුම් නිර්මාණකරුවන්, ආභරණ සැපයුම් කරුවන් හා මාව විශ්වාස කරලා මා ළඟට ආපු මගේ සේවාදායකන් හැම දෙනාම මේ වෙලාවේදි ඉතාම ආදරයෙන් මතක් කරනවා.

# තවමත් ඔබ තනිකඩද?

## විවාහය ස්ථිර වනතුරු
## පුංචි මුදලකට යෝජනා අපෙන්



ලියාපදිංචිය නොමිලේ
ඔබේ පෞද්ගලිකත්වය සුරකිනු ඇත.

අතැගිලි
ඔන්ලයින් මංගල සේවය